**ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානයට ආධාර කිරීමට**
**අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය,**
**ප්‍රජා සංවිධාන හා රජය සමග එක් වී කටයුතු කරයි**

ප්‍රතිසන්ධාන කටයුතුවලට ප්‍රාදේශීය ප්‍රජාව සම්බන්ධ කර ගැනීම සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය, ග්ලෝබල් කොමියුනිටීස් ආයතනයට දළ වශයෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.6 ($ 10,000,000) ආධාර මුදලක් ජුනි 29 වැනිදා ලබා දුන්නේය.

තුන් අවුරුදු ව්‍යාපෘතියක් වන මේ මගින් ප්‍රතිසන්ධානයට ඇති අභියෝග ජය ගැනීමට ශ්‍රී ලංකා රජය හා ප්‍රාදේශීය සිවිල් සමාජ සමග සහයෝගයෙන් කටයුතු කරනු ඇත. හවුල් හා සියල්ලන් ම ඇතුළත් වන ශ්‍රී ලාංකික අනන්‍යතාවක් ප්‍රවර්ධනය කිරීමටත්, සමාජ ආර්ථික අසමානතා අඩු කිරීමටත් බහු-ආගමික හා බහු-වාර්ගික ප්‍රජාවන් අතර ප්‍රතිවර්තනය ශක්තිමත් කිරීමටත් මෙම ව්‍යාපෘතිය මගින් කටයුතු කරනු ඇත.

“රටේ යහපතටත්, සෞභාග්‍යයටත් වැඩ කරන සමාජයක් ගොඩ නැගීමට ශ්‍රී ලංකාවේ ජනතාව හා රජය ගන්නා උත්සාහයට ආධාර කිරීමට ලැබීම ගැන අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය ආඩම්බර වේ“ යයි ශ්‍රී ලංකාවේ හා මාලදිවයිනේ (USAID) අධ්‍යක්ෂ රීඩ් අයිෂ්ලීමන් මහතා ප්‍රකාශ කළේය.

මෙහි ක්‍රියාකාරකම් තුළින් ප්‍රාදේශීය ප්‍රජාවන් අතර පුරවැසියන් මෙහෙයවන ප්‍රයත්නයන් හා ජාල සබඳතා පුළුල් කරමින් යුද්ධයේ බලපෑමට ලක් වූ අයට ආධාර කරනු ඇත. ඉතා අවශ්‍ය අයට තීරණාත්මක සේවා සපයන හා මානසික සමාජ සේවා ලබා ගැනීමේ හැකියාව වැඩි කරන පළාත් පාලන ආයතන හා ප්‍රජා මූල සංවිධාන මෙම ව්‍යාපෘතියෙන් ශක්තිමත් කෙරෙනු ඇත. මෙයට අමතරව වගකීම් සහිත පුරවැසිභාවය හා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීමට නායකත්වය සැපයීමට තරුණයන්ට හා කාන්තාවන්ට ඇති අවස්ථා වැඩි කිරීම ද මෙම ව්‍යාපෘතියෙන් සිදු වනු ඇත.

අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනය අවුරුදු 60කට වැඩි කාලයක් තිස්සේ රජයට හා ශ්‍රී ලංකාවේ ජනතාවට සංවර්ධන හා මානුෂීය ආධාර සපයා තිබේ.